| මගේ අංකය<br>**எனது இல**<br>**My No** | DSD/HO//05/MF/01/චක්‍රලේඛ | ඔබේ අංකය<br>**உமது இல**<br>**Your No** | ........................ | දිනය<br>**திகதி**<br>**Date** | 2019.10.29 |
|---|---|---|---|---|---|

සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ :- 2019/14
සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති කළමණාකරුවන්,

**<u>2019 වර්ෂය සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු කොටස්කරුවන්ට අතුරු ලාභාංශයක් ප්‍රකාශයට පත් කිරීම.</u>**

**01.හැඳින්වීම.**

බැංකු කළමනාකරණ මණ්ඩල තීරණ අංක 2019/58/05 අනුව සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමාජිකයන්ට පූර්ව ලාභාංශයක් ප්‍රකාශ කරනු ලබයි.

ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම සඳහා මෙම චක්‍රලේඛ නිකුත් කරනු ලබන බව දැනුම් දෙමි.

**02. ලාභාංශය ප්‍රකාශයට පත් කිරීම.**

සමෘද්ධි ප්‍රජාමූල බැංකු විසින් 2019.01.01 දිනට සම්පූර්ණ කරන ලද සෑම රු.500/- ක් වූ කොටසක් සඳහා පහත නිර්නායක වලට යටත්ව කොටස්කරුවන්ට 5% ක ලාභාංශයක් ප්‍රකාශයට පත් කළ යුතුයි.

I. 2018.12.31 දිනෙන් අවසන් වර්ෂයට ලාභයක් උපයා තිබීම.
II. 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ කොටස්කරුවන්ට ගෙවිය යුතු ලාභාංශ ගිණුමට විසර්ජනය කළ අරමුදල, 2019.01.01 දිනට සම්පූර්ණ කරන ලද කොටස් සඳහා 5% ක පූර්ව ලාභාංශ මුදලක් ගෙවීමට ප්‍රමාණවත් විය යුතුය. (2018 වර්ෂයේ කොටස්කරුවන්ට ගෙවිය යුතු ලාභාංශ ගිණුමට විසර්ජනය කරන ලද අරමුදල පදනම් කරගෙන.)
III. පොදු ලෙජරයේ ශේෂ සමග තැන්පතු, ණය සහ ආයෝජන වලට අදාල ශේෂ පිරික්සුම් තුලනය වී තිබිම. (පූර්ව ලාභාංශයක් ගෙවන දිනට පෙර මාසයේ අවසාන දිනට)
IV. 2019 වර්ෂය තුළ වෙනත් ලාභාංශයක් ප්‍රකාශයට පත් කර නොමැතිවීම. (වෙනත් වර්ෂවල නොබෙදූ ලාභාංශයක් පදනම් කරගෙන)

03. පසුගිය වර්ෂයක හෝ වර්ෂ කිහිපයක් අනුමත වූ මූල්‍ය ප්‍රකාශන අනුව කොටස්කරුවන්ට ගෙවිය යුතු ලාභාංශ ගිණුමේ ඇති නොබෙදූ අරමුදල් යොදාගෙන 5% කට නොඅඩු ලාභාංශ ප්‍රකාශ කිරීමට හැකියාව ඇත්නම් ඒ අනුව ද කටයුතු කළ හැකිය.

04. ඉහත ඡේද අංක 02 හා 03 හි සඳහන් සුදුසුකම් සපුරා නොමැති සමෘද්ධි ප්‍රජාමූල බැංකු විසින් 5% ක වාර්ෂික පොලී මුදලක් 2019.01.01 දිනට සම්පූර්ණ කරන ලද සාමාජික කොටස් සඳහා ගෙවීමට කටයුතු කළ යුතුය.

05. මෙම උපදෙස් අනුව පූර්ව ලාභාංශය ප්‍රකාශයට පත් කිරීමට අපේක්ෂිත සමෘද්ධි ප්‍රජාමූල බැංකු විසින්, පාලක මණ්ඩලය කැඳවා අතුරු ලාභාංශ ප්‍රකාශයට පත් කරන යෝජනාව ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන 2019.12.25 දිනට පෙර අදාල කාර්යය ඉටුකිරීමට කටයුතු කළ යුතුය.

06. ලාභාංශය ප්‍රකාශයට පත්කිරීම හෝ කොටස් පොලිය ගෙවීමේ දී මෙහෙයුම් උපදෙස් අංක 12 හා ඊට අදාල එකතුන් හී අනෙකුත් උපදෙස් ඒ පරිද්දෙන්ම වලංගු කර ගත යුතුය.

07.මෙම උපදෙස් පදනම් කරගෙන, අනෙකුත් විසර්ජන අරමුදල් භාවිතා කිරීමට මෙමඟින් අවසර නැති බව දන්වමි.



එස්.ඊ.ආර්.ටී.එම්.එස්.පී.බණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්.

<u>පිටපත්</u>

1. ලේකම් - ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය. - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්/ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
3. අතිරේක අධක්‍ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
4. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - දැ.ගැ.ස. හා අ.ක.ස.
5. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ස.
6. ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
7. සියළුම අධ්‍යක්‍ෂවරුන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
8. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්. - කා.දැ.ස.
9. සියළුම සමෘද්ධි බැංකු පාලක මණ්ඩල සභාපතිවරුන්. - දැ.ගැ.ස .
10. සියළුම සමෘද්ධි බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන්. - දැ.ගැ.ස .